ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 8 කාණ්ඩය 2 2011 දෙසැම්බර්

# වතු සේවක වැටුප් ඉහළ යාම කුඩා තේ වතු හිමියාට බලපායිද?

තේ කර්මාන්තය වනාහි ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට විශාල දායකත්වයක් සපයන කර්මාන්තයක් බව අප මනාව දන්නා කරුණකි. එබැවින් මෙම කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය රටෙහි ජාතික ආදායමට සෘජුවම බලපායි. එම නිසා වතු ක්ෂේත්‍රය තුල සිදු වන විචලනයන් පිළිබඳව නිරන්තර අවධානය අති වැදගත්ය. මේ අනුව වතු සේවක වැටුප් ඉහළ යාම මගින් තේ වගා කරුවන්ට සිදු වන බලපෑම විශ්ලේෂණය කාලෝචිතය.

වර්තමානයේ ඉතා ඉහළ මට්ටමක පවතින ජීවන වියදම හමුවේ සිදු වූ වැටුප් වැඩිවීම වතු කම්කරු ප්‍රජාවට සහනදායී වතාවරණයක් බව පිළිගතයුතුය. තවද මෙමගින් ක්ෂේත්‍රයේ දැනට පවතින්නාවූ කම්කරු හිඟය අවම කරලමින් තේ කර්මාන්තය තුළ කම්කරුවන් රඳවා ගැනීමටද ධනාත්මක බලපෑමක් වේ යැයි ද උපකල්පනය කළ හැක.

නමුත් ඉහත සඳහන් කරන ලද වාසිදායක තත්වයන්ට අමතරව මේ වාතාවරනය තුල තේ කර්මාන්තයට දැඩි අභියෝගයකට මුහුණ දීමට ද සිදු වේ. එනම් වැඩි වූ සේවක වැටුප් හමුවේ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම තුළින් මතු වන ගැටළු වලට සැලසුම් සහගතව මුහුණ දීමයි. ජාත්‍යන්තර තේ වෙළඳපොළෙහි අපගේ තරඟකරුවන් හා සැසඳීමේදී අපගේ නිෂ්පාදන වියදම ඉතා ඉහළය. මෙවන් වාතාවරණයක් තුල නිෂ්පාදන පිරිවැය තව තවත් ඉහළ යාම මගින් වෙළඳපොළෙහි තරඟකරීත්වයට අනිසි බලපෑමක් එල්ල වේ. තත්වය කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත තේ සඳහා ජාත්‍යන්තරයේ පවතින කීර්තිනාමය රැක ගැනීමට අපගේ තේ වල ගුණාත්මකභාවය ආරක්ෂාකර ගැනීම අති වැදගත් බව නොකිවමනාය. තවද ඉහළ යන නිෂ්පාදන පිරිවැය හමුවේ තේ ලාභ උපයන භෝගයක් ලෙස තවදුරටත් පවත්වා ගැනීමට විකල්ප ක්‍රමවේදයන්ට යොමු වීම ද අත්‍යාවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ලෝකය හමුවේ ඔසවා තැබීමට කුඩා තේ වතු හිමියාගේ දායකත්වය අති මහත්ය. ජාත්‍යන්තර තේ වෙළඳපොළෙහි අපගේ තරඟකරුවන් හා තරග කරමින් ගුණාත්මයෙන් හෙබි ශ්‍රී ලංකා නැවුම් තේ සැපයීමට වැඩි දායකත්වයක් ලබා දෙන්නේ කුඩා තේ වතු හිමියා වේ. එම නිසා ඔවුනට මෙම වැටුප් වැඩිවීම කෙලෙස බලපායිද යන්න සොයා බැලීම ඉතා වැදගත්ය.

සේවක වැටුප් වැඩි වීම හා සමගාමීව නිෂ්පාදන පිරිවැයද වැඩිවන බව අප දන්නා කරුණකි. නිෂ්පාදන පිරිවැය තීරණය කරන්නාවූ වැදගත් නිර්ණායකයක් ලෙස ඵලදායීතාව දැක්විය හැක. කම්කරු ඵලදායීතාව වැවිලි සමාගම් වතුවලට සාපේක්ෂව කුඩා තේ වතු ඉහළ අගයක් පෙන්වයි. වැවිලි සමාගම් වතු සඳහා හෙක්ටයාරයකට ශ්‍රම අවශ්‍යතාවය 3.21 වන අතර කුඩා තේ වතු සඳහා එය 2.78 වේ. මේ තත්වය මත සේවක වැටුප් ඉහළ යෑමෙහි බලපෑම වැවිලි සමාගම් වතුවලට වඩා කුඩා තේ වතු සඳහා අවම වේ යයි අනුමාන කළ හැක.

තවද මෙම ක්ෂේත්‍රයෙහි දෛනික වැටුප් සඳහා බලපාන්නාවූ සාධක ලෙස, තේ වෙළඳපොල තත්වය (එනම් අමු දළු කිලෝවක් සඳහා වන මිල), ජීවන වියදම හා ශ්‍රම සුලබතාවය සැලකිය හැක. තවද සමාගම් වතු අංශයේ මෙන් නොව කම්කරුවන්ගේ කේවල් කිරීමේ හැකියාව කුඩා තේ වතු අංශයේ අවමය. මේ නිසා බොහෝදුරට ප්‍රාදේශීය වශයෙන් කම්කරු වේතනයෙහි වෙනස් කම් දැකිය හැක.

මෑත කාලයේදී සිදුකළ සමීක්ෂණයකට අනුව ලබාගත් කම්කරු වැටුප් පිළිබඳ තොරතුරු වගුව (i) න් දක්වා ඇත



වගුව (1) සමාගම් හා කුඩා තේ වතු අංශයන් හී දෛනික වැටුප් පිළිබඳ සංසන්දනය

| වර්ෂය | සමාගම් වතු අංශය | කුඩා තේ වතු අංශය | |
|---|---|---|---|
| | | පිරිමි | ගැහැනු |
| 2002 | 165.15 | 251.00 | 183.00 |
| 2003 | 165.15 | 276.86 | 174.76 |
| 2004 | 200.25 | 304.00 | 218.00 |
| 2005 | 200.25 | 300.00 | 217.00 |
| 2006 | 285.50 | 333.00 | 234.00 |
| 2007 | 320.00 | 375.00 | 263.00 |
| 2008 | 320.00 | 440.00 | 304.00 |
| 2009 | 447.75 | 488.00 | 356.00 |
| 2010 | 447.75 | 543.00 | 391.00 |
| 2011 | 572.00 | | |

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 8 කාණ්ඩය 2

2011 දෙසැම්බර්

සේවක වැටුප් වැඩි වීම සමාගම් වතු අංශයට බලපා තිබුනද කුඩා තේ වතු සඳහා මේ වන තුරු බලපෑමක් සිදු වූ බවක් පෙන්නුම් කෙරෙන්නේ නැත. නමුත් පසුගිය වැටුප් වැඩි වීම් සිදු වූ අවස්ථාවන් හී මෙම අංශයෙහි ක්‍රියාකාරීත්වය විශ්ලේෂණයේදී ඒවායේ බලපෑම හදුනාගත හැක ඒ අනුව දැනට වෙනසක් සිදු නොවූවද ඉදිරියේදී ගැටළුකාරී වතාවරණයක් උදා වේ යැයි අනුමාන කළ හැක. මෙම වකවානුවේදී අමු දළු වල මිල අඩු මට්ටමක පැවතීම නිසාදෝ වැටුප් ඉහළ යාමක් සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවුනද ඉදිරියේදී ඒ සඳහා ඉල්ලීම් මතු විය හැකි බව අපගේ නිගමනයයි. විශේෂයෙන් සමාගම් වතු ආශ්‍රිතව පවතින කුඩා තේ වතු සඳහා කෙටි කාලයකදීම මෙම තත්වය උද්ගත විය හැකි බව අපට පෙනී යයි



අපගේ නිගමනයන්ට අනුව සේවක වැටුප් වැඩිවීම හමුවේ මෙම ක්ෂේත්‍රයෙහි දෛනික වැටුප රු 450 සිට රු 650 අතර අගයකින් වැඩි විය හැකි බවට සඳහන් කළ හැක. කුඩා තේ වතු ක්ෂේත්‍රයේ සාමාන්‍ය ජාතික ඵලදායිතාවය වර්ෂයකට අක්කරයකට අමු දළු කිලෝ 3954 යයි සැලකූ විට වර්තමානයේ අමු දළු කිලෝවක් සඳහා වන නිෂ්පාදන වියදම රු 37.80 වේ. උක්ත උපකල්පනයන්ට අනුව නිෂ්පාදන පිරිවැයෙහි 14% කින් වැඩි වී, එනම් රු 43.19 දක්වා වැඩි විය හැක.

ක්‍රියාමාර්ග ගැනීම වැදගත්ය. එම නිසා ඵලදායිතාව ඉහළ නංවා නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමට උත්සුක විය යුතුය. ඵලදායිතාව වැඩිකර ගැනීමට නම් භූමියෙහි හා සේවකයින්ගේ ඵලදායිතාව වර්ධනය කර ගත යුතුය. නිර්දේශිත කෘෂි පිළිවෙත් අනුගමනය කිරීම තුළින් ආදායම වැඩි කර ගැනීමට උනන්දු විය යුතුය. තවද නිසි පාංශු සංරක්ෂණ විධි අනුගමනය කිරීමද වැදගත්ය. මිශ්‍ර භෝග වගාවන්ට යොමු වීම, වැනි ක්‍රියාමර්ග ගැනීම මගින් භූමියෙහි ඵලදායිතාව වැඩි කර ගත හැක. නිෂ්පාදන පිරිවැයෙන් කම්කරු වියදම වැඩි ප්‍රතිශතයක් ගනී. එම නිසා ශ්‍රමික ඵලදායිතාව පිළිබඳ ඉහළ අවධානයක් යොමු කළ යුතුය. මෙම වකවානුව තුළදී යන්ත්‍ර භාවිතයට යොමු වීම කාලෝචිත වේ. තවද නිසි කළමනාකරණයකින් යුතුව මානව සම්පත් යොදා ගැනීම අති වැදගත්ය.

**"ඵලදායිතාව වැඩිකර ගැනීමට නම් භූමියෙහි හා සේවකයින්ගේ ඵලදායිතාව වර්ධනය කර ගත යුතුය නිර්දේශිත කෘෂි පිළිවෙත් අනුගමනය කිරීම තුළින් ආදායම වැඩි කර ගැනීමට උනන්දු විය යුතුය."**

වගුව (ii) ඵලදායිතාව වර්ෂයකට අක්කරයකට අමු දළු කිලෝ 3954 ලෙස ගත් විට අමු දළු කි.ග්‍රෑ.1 ක් නිෂ්පාදනය සඳහා වන පිරිවැය රු.

| පිරිවැය අයිතමය | වැටුප් වැඩි වීමට පෙර | වැටුප් වැඩි වීමට පසු | වෙනස |
|---|---|---|---|
| සාමාන්‍ය වියදම් | 4.00 | 4.50 | 0.50 |
| දළු නෙළීම | 20.93 | 23.55 | 2.62 |
| පොහොර දැමීම | 3.18 | 4.17 | 0.99 |
| අනෙකුත් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් | 9.68 | 10.48 | 0.79 |
| මුළු නිෂ්පාදන පිරිවැය | 37.80 | 43.29 | 5.40 |

වගුව (ii) ඵලදායිතාව වර්ෂයකට අක්කරයකට අමු දළු කිලෝ 1882 නම් අමු දළු කි.ග්‍රෑ.1 ක් නිෂ්පාදනය සඳහා වන පිරිවැය රු.

| පිරිවැය අයිතමය | වැටුප් වැඩි වීමට පෙර | වැටුප් වැඩි වීමට පසු | වෙනස |
|---|---|---|---|
| සාමාන්‍ය වියදම් | 8.40 | 8.76 | 0.56 |
| දළු නෙළීම | 23.92 | 26.91 | 2.99 |
| පොහොර දැමීම | 4.49 | 5.76 | 1.28 |
| අනෙකුත් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් | 18.79 | 19.77 | 0.98 |
| මුළු නිෂ්පාදන පිරිවැය | 55.60 | 61.41 | 5.81 |

අඩු ඵලදායිතා මට්ටමක් ලෙස වර්ෂයකට අක්කරයකට අමු දළු කිලෝ 1882 ගත් කළ අමු දළු කිලෝවක් සඳහා නිෂ්පාදන පිරිවැය රු 55.60 ද රු 61.41 දක්වා වැඩි විය හැක.

කුඩා තේවතු හිමියා ගේ නිෂ්පාදන පිරිවැය මෙලෙස ඉහළ යාම ආර්ථික මෙන්ම සමාජයීය ගැටළු රාශියකට තුඩු දෙන්නක් බව නොඅනුමානය. මෙම තත්වය තුළ තේ ක්ෂේත්‍රයට සිදුවිය හැකි අහිතකර බලපෑම අවම කිරීමට

අවසාන වශයෙන් මෙම ගැටළුව සඳහා පමණක් නොව ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය මේ වන විට මුහුණදෙන විවිධාකාරයේ අභියෝග හමුවේ තේ වෙළඳපොළෙහි ස්ථාවරව රැඳී සිටීමට නම් නිෂ්පාදන විවිධාංගීකරණය, වටිනාකම වැඩි කරන ලද නිෂ්පාදන සඳහා යොමු වීම වැනි විකල්ප ක්‍රියාමාර්ග වලට අවතීර්ණ වීම අත්‍යාවශ්‍ය වේ.

**ආචාර්ය එච්. ඩබ්. ශ්‍යාමලී**